**ලංසු ආරාධනයයි.**

## සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් (CPSTL)
## 2025/2026 වර්ෂ සඳහා කොලොන්නාව නිමාව ආපනශාලාව පවත්වා ගෙනයාම සඳහා ලංසු කැඳවීමයි. (ලංසු අංකය KPR/49/2025)

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයේ (CPSTL) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC-Minor) සභාපති විසින් 2025/2026 වර්ෂ සඳහා කොලොන්නාව ප්‍රධාන ආපනශාලාව පවත්වා ගෙනයාම සඳහා පිළිගත් ආපනශාලා සේවාවන් සපයන්නන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු මිල ගණන් කැඳවනු ලැබේ.

ලංසුකරණය පිළිබඳ විස්තර තොරතුරු අපගේ (CPSTL) වෙබ් අඩවිය වන www.cpstl.lk වෙතින් ලබාගත හැකිවන අතර, ලංසු ලිපි ලේඛණ ආපසු **නොගෙවන** රුපියල් දහසක (1000.00) ගාස්තුවක් **CPSTL** ආයතනයට ගෙවීමෙන් හා කළමණාකරු (ප්‍රසම්පාදන) වෙත ලිඛිත අයදුම්පතක් (ඉල්ලීමක්) ඉදිරිපත් කිරීමෙන් අනතුරුව **2025.10.22 වන දින සිට 2025.11.04 වන** දින දක්වා සාමාන්‍ය රාජකාරි දිනවලදී **09.00** පැයේ සිට **14.00** පැය දක්වා පමණක් ප්‍රසම්පාදන කළමණාකාර ප්‍රසම්පාදන අංශය, පළමු මහල, නව ගොඩනැගිල්ල, කොලොන්නාව වෙතින් ලංසු ලිපිලේඛන ලබාගත හැකිය. තවද ප්‍රසම්පාදන කළමණාකාර කාර්යාලයේදී ගාස්තු ගෙවීමකින් තොරව (නොමිලේ) මෙම ලිපි ලේඛණ පරීක්ෂාකර බැලිම ද කල හැකිය.

සියළුම අයදුම්කරුවන් වෙනුවෙන් ලංසු පිලිබඳ ගැටළු හෝ අපැහැදිලි තැන් සාකච්ජා කිරීම සඳහා පෙර දැනුවත් කිරීමේ සාකච්ජාවක් **(Pre Bid Meeting)** 2025.10.29 දින **පෙ. ව. 10.00** ට **කොලොන්නාව CPSTL ආයතනයේ මානව සම්පත් කළමනාකරණ රැස්වීම් ශාලාවේදී** පැවැත්වීමට කටයුතු කරන බවත්, ඊට සහභාගිවී මෙදිනම ආපනශාලාව පරීක්ෂා කිරීමට හැකි බවත්, දන්වමි.

අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී ආරක්ෂිත බැඳුම්කරයක් (Tender Security) ලෙස **ආපසු ගෙවන** මුදලින් රුපියල් **විසිපන් දහසක් (25,000.00)** මුදලක් CPSTL ආයතනය වෙත ගෙවීමෙන් හෝ එම වටිනාකමෙන් යුත් බැංකු අණකරයක් හෝ අයදුම්පත සමඟ ඇමිණිය යුතුය. අයදුම්පත් සමඟ ඉදිරිපත් කෙරෙන ආරක්ෂිත බැදුම්කරය **2026 පෙබරවාරි 01 දින** දක්වා වලංගු විය යුතුය.

තවද CPSTL ආයතනයේ බැංකු ගිණුමට මෙම මුදල බැරකර අදාල රිසිට්පත සමඟින් ප්‍රසම්පාදන කළමණාකාර වෙත ලිඛිත ඉල්ලීමක් procure@cpstl.lk දරණ ඊමේල් ලිපිනය වෙත විද්‍යුත් තැපෑලෙන් එවිය යුතුය. CPSTL ගිණුමට ආපසු නොගෙවන ගාස්තුව ලැබුණ පසුව ලංසු ලේඛණ කට්ටලය ප්‍රසම්පාදන කාර්යාංශය මඟින් විද්‍යුත් තැපෑලෙන් නිකුත් කරනු ඇත.

නිසි අයුරින් සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් ලංසු භාරගන්නා අවසාන දිනය වන **2025.11.04** වන දින **14.00** පැයට පෙර පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රධාන ගේට්ටුව අභියස ආරක්ෂක කාර්යාලයේ තබා ඇති ප්‍රසම්පාදන කාර්යාංශයේ ලංසු පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ tenders@cpstl.lk විද්‍යුත් තැපෑල ලිපිනය වෙත ද ලංසු ඉදිරිපත් කල හැකිය. අදාල දිනයේ නියමිත වේලාවටම එම ලංසු විවෘත කරනු ලබන අතර, ඉහත වේලාව ඉක්මවා ගොස් ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන බව ද දන්වමි. ලංසු විවෘත කරන අවස්ථාව සඳහා අදාල ලංසුකරුට හෝ ඔහු විසින් ලිඛිතව නම්කරනු ලබන එක් අයකුට පමණක් සහභාගි විය හැකිය. වැඩි දුරටත් අවශ්‍ය විස්තර ලංසු පත්‍රිකාවේ සඳහන්ව ඇත.

සියළුම පැහැදිලි කර ගැනීම් සඳහා දුරකථන **011-2572155** හෝ **011-2572156** මඟින් ප්‍රසම්පාදන කාර්යාලයෙන් විමසිය හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (DPC- Minor),
කළමණාකාර ප්‍රසම්පාදන,
සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්,
ප්‍රසම්පාදන කාර්යාලය,
පළමු මහල, නව ගොඩනැගිල්ල,
කොලොන්නාව,
වැල්ලම්පිටිය.